# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලද.

නො. 7,876 — 1931ක්වූ අගෝස්තු මස 21 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV.— හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—වේයන්ගොඩ කුඩු දූවවන මෝලක් පිහිටුවීමට සහ කුලී ලයිම් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තු වල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මනාපණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ; ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 20,278. ගම—හිරිපිටිය.

| නො. | ඉඩමේ නම. | අනුම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දෙල්ගහවත්ත, පරිපණම නො. 119න් කොටසක් | පොල්ගස් 69ද, පුවක්ගස් 82ද, අඹගස් 2ද, සිය බිලිංගහක්ද, නාරන්ගහක්ද, කොස්ගස් 6ද, කෙසෙල් පඳුරු 10ද, වෙරළුගහක්ද, කජුගස් 3ද, ගොරකගස් 5ක් සහ බෙලිගහකින් යුත් ඉඩම | හිරිපිටියේ දෙවටුපේඩිගේ සිලිප්පු | 0 2 12·62 |
| 2 | දෙල්ගහවත්ත, පරිපණම නො. 118 | මුඩුබිම .. .. | වික්‍රමපේඩිගේ මෙණු .. | 0 0 0·69 |
| 3 | දෙල්ගහවත්ත, පරිපණම නො. 120න් කොටසක් | කෙසෙල් පඳුරු තුනකින් යුත් ඉඩම .. | වික්‍රමපේඩිගේ සාන්තියා, වික්‍රමපේඩිගේ සෙලෙන්චි, තුවරපේඩිගේ පොඩියා සහ එලිසබෙත් ප්‍රනාන්දු | 0 0 0·30 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 25වෙනි දින පෙරවරු 10යේ කාලයට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 18වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

එච්. පී. කෑෆ්මන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වම්හ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ගොන්දෙන්නාවේ පිරිමි ළමයින්ට අළුත් පාඨශාලාක් තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රීසභාවේ මනාපණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 9,027. ගම—උඩබුලත්ගම පස්බාගකෝරළේ පත්තුනුපිටිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පිටසිවනාතවත්ත | .. (වමානැති) වත්ත .. | පත්තුනුපිටියේ ඇ. ජේ. ජේ. නෝනා .. | 0 0 0·3 |
| 2 | උඩහවත්පලවනාතවත්ත | එම .. | කහඹන ඇස්. ඇම්. කිරිබන්ඩා .. | 0 0 1·6 |
| 3 | උඩහවත්පලකුඹුර | .. කුඹුර .. | එම .. .. | 0 0 1 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 4 | දළුක්ගහවගලකුඹුර .. | කුඹුර .. | කොත්මලේ කොටගේපිටියේ ජේ. ඇම්. උක්කුබන්ඩා | 0 0 5·6 |
| 5 | ගොඩකුඹුර .. | එම .. | පත්තුනුපිටියේ ඇස්. ඇම්. කිරිබන්ඩා, ඇස්. ඇම්. හින් කිරිමැණිකා, ඇස්. ඇම්. උක්කුබන්ඩා, ඇස්. ඇම්. උක්කුමැණිකා | 0 0 2·7 |
| 6 | වෑතිගේකුඹුර .. | එම .. | එම .. .. .. | 0 0 3 |
| 7 | අඹලන්ඔවිටවත්ත .. | වවාතිබෙන වත්ත | එම .. .. .. | 0 1 37·4 |
| 8 | එම .. | එම .. | පත්තුනුපිටියේ ඇම්. පී. මුතුවා, ඇම්. පී. පොරතලී, ඇම්. පී. පංචු, ඇම්. පී. සිරිමලී, ඇම්. පී. රන්තු, ඇම්. පී. ලියන්නා, ඇම්. පී. කිරිසාදුවා සහ ඩී. ඩබ්ලිව්. නාභායක්කාර | 0 2 24·5 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 25වෙනි දින පස්වරු 2යේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටිනා මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 17වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. ඩී. ගොඩ්සෝල්,
මහනුවර පලාතේ ආණ්ඩුවේ උප ඒජන්ත වමහ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මාතර දිස්ත්‍රික්කේ කන්දබඩපත්තුවේ කඹුරුපිටියේ සිට මාවරලට යන පාරේ නොම්මර 15යේ කනුව අසල අභිනව පාලමට පාරවල්තැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට කාරක මන්ත්‍රිසභාවේ මනාප්‍රණය ඇතුව උතුමාණන්වහන්සේගෙන් හිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

නො. 97 දරණ අවසාන සිතියමේ නො. 2 දරණ අතිරේක සිතියම. ගම—රන්වාගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 137A | මහඹකන්දවත්ත .. | පුවක්ගස් 13ක්ද, දෙල්ගස් 3ක්ද, කිතුල් ගස් 1ක්ද, ගොඩපරගහක් සහ රඹුටන් ගහක් ඇති වත්ත | (1) චාර්ල්ස් ප්‍රැන්සිස් විජේරත්න, (2) ඩී. ඇන්. වෙල්ලප්පුලි සහ (3) දෙන් සිසිලියානා | 0 0 8·1 |
| 137B | එම .. | දෙල්ගහක් ඇති වත්ත .. | (1) මාකඳුරේ පදිංචි අබේගුනසේකර ලියනගේ අනදහාමි, (2) මාහල්ලේ පදිංචි අබේගුනසේකරලියනගේ හින්හාමි, (3) දෙමටපිටියේ අබේගුනසේකරලියනගේ ඇලැන්සිනා, (4) පල්ලේවෙල පදිංචි එම සිලිහුහාමි, (5) එම දොන් ඇලෙක්සන්ඩර්, (6) මොහොට්ටිගේ නොන්චොහාමි, (7) අබේගුනසේකරලියනගේ දොන් තියඩෝරිස්, (8) ඇල්ෆ්. බී. දිසානායක, (9) අබේගුනසේකරලියනගේ දොන් කරලිනාගේ ලමයා, (10) එන්ගෙරිනා සුබසිංහ | 0 0 2·5 |
| 85G | එම .. | ඉඹුල්ගස් 3ක්ද, කොස්ගහක් සහ හින් නාරන්ගහක්ද ඇති වත්ත | එම .. .. | 0 0 11·3 |
| 85H | එම .. | මුඩුබිම .. .. | එම .. .. | 0 0 0·7 |
| 85I | පැලකැලිය .. | කොස්ගහක්ද, හල්මිල්ලගහක් සහ පුවක්ගස් 98ක්ද ඇති වත්ත | (1) දෙල්පි නොහොත් ඇම්. එච්. විජේරත්න, (2) ගමගෙ දනච්චො, (3) ගමගේ සිලප්පු | 0 0 19·1 |
| 85J | අළුත්වත්තේකොරටුව | පුවක්ගස් 18ක් ඇති වත්ත .. | මීපාවිට පදිංචි දොන් කොරනේලිස් විමලගුනරත්න | 0 0 3·6 |

නො. 55 දරණ අවසාන සිතියමේ නො. 1 දරණ අතිරේක සිතියම. ගම—කොරඹුරුවාන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 13A | නුගෙදරවත්ත .. | කොස්ගස් 3ක්ද, දෙල්ගස් 5ක්ද, පොල්ගහක්ද, පුවක්ගස් 82ක්ද, ඉඹුල්ගස් 2ක්ද, අඹගහක් සහ කොට්ටම්බගහක්ද ඇති වත්ත | රන්වාගොඩ පදිංචි ඒ. ඩබ්ලිව්. විජේරත්න | 0 0 17·1 |
| 13B | එම .. | දෙල්ගස් 2ක්ද, නාරන්ගහක්ද, කොට්ටම්බගහක්ද, කිතුල්ගහක් සහ පුවක්ගස් 87ක්ද ඇති ඉඩම | එම .. .. | 0 0 9·1 |
| 13C | දෙඹගහඹකන්ද .. | පුවක්ගස් 58ක්ද, ඉඹුල්ගහක්ද, දෙල්ගස් 4ක්ද, කොට්ටම්බගහක් සහ රබර්ගස් 52ක්ද ඇති ඉඩම | (1) තෝමස් ජයවර්ධන, (2) දොන් පොලෝරිස් විමලගුනරත්න, (3) දොන් දියෝනිස් විමලගුනරත්න, (4) මල්වරවෙලප්පුලි බිංගිහාමි, (5) මල්වරආරච්චිගේ දොන් කොර්නේලිස්, (6) දොන් සුවාරිස් සමරවික්‍රම සහ තවත් අය | 0 0 16·2 |
| 13D | එම .. | හික්ගහක්ද, දෙල්ගස් 10ක්ද, රබර්ගස් 3ක්ද, පොල්ගහක්ද, පුවක්ගස් 45ක්ද, ඉඹුල්ගස් 5ක්ද, කිතුල්ගස් 3ක් සහ කොස්ගහක්ද ඇති ඉඩම | එම .. .. | 0 0 31·2 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දන්නුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 15වෙනි දින පූර්වභාග 10යේ කනිසමට මාතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 15වෙනි දින
මාතර කච්චේරියේදීය.

එච්. ජේ. ඇල්. ලියැලියාර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වමහ

## වැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම්.

### මරදානේ අර්ත් තැපැල් කන්තෝරුව සඳහා ගත් ඉඩම බදුදීම.

මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 1වෙනි දින පටන් අවුරුද්දකට මරදානේ අර්ත් තැපැල් කන්තෝරුව සඳහා ගත් ඉඩමේ පිහිටි ගොඩනැගිලි සහ ගස්වල බද්ද මිලයට ගැනීම පිණිස සීල් තබා එවනු ලබන වැන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර බස්නාහිර පළාතේ දිසාපතිතුමා විසින් භාරගන්නවා ඇත.

2. එකී වැන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 31වෙනි සඳුදා සවස 1 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එම වේලාවට කඩාබලනු ලැබේ.

3. වැන්ඩර්ස් හෙවත් ඉල්ලුම්පත්‍ර එවන්නාවූ සියලුදෙනාම එම ඉල්ලුම්පත්‍ර හැබෑවූ ඒවා බව දිසාපතිතුමාට ඒත්තුගැනීම පිණිස තමන් හෝ තමන් වෙනුවෙන් ඊට නිසි බලතලත් අයෙක් එම වේලාවට පෙණීසිටින්ට ඕනෑය.

4. වැඩි විස්තර කොළඹ කච්චේරියේදී ඉල්ලා බලාගත හැක.

ඇම්. ඇම්. වෙඩර්බර්න්,
බස්නාහිර පළාතේ දිසාපතිතුමා වෙනුව.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 17වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

කොන්දේසි.

1. මිලයටගන්නා අය සම්පූර්ණ බදුමුදල වෙන්දේසි දවසේ දීම ගෙවිය යුතුයි.

2. මිලයටගත් අයට ඉඩමේ ඵලප්‍රයෝජන ගැනීමේ හා එහි ගොඩනැගිලි තිබේනම් ඒවායේ පදිංචිවීමේ අයිතිය තිබේවි.

3. මිලයටගත් අය හෝ ඔහුගේ වැඩකරුවන් විසින් හෝ කිසිම ගසක් කැපීම, වැටක මායිමක හෝ ගොඩනැගිල්ලක වෙනස්කිරීම තහනම්ය.

4. දිසාපතිතුමා විසින් ඉල්ලීමක්කළ විටකදී මිලයට ගත් අය වැටවල් බැඳීමට බැඳී සිටියි.

5. මිලයටගත් අය විසින් එම ඉඩම යහපත්ලෙස පිරිසිදුව තබාගැනීමද, සෑම අයබදුම ගෙවීමද, නාගරික සභාවේ අණපණත්වලට එකඟව ක්‍රියාකිරීමද කළයුතුයි.

6. දිසාපතිතුමාට හෝ එතුමාගේ බලයපිට ක්‍රියාකරණ කෙනෙකුට බදුකාරයාට මාසයක් කල්දීමෙන් එහි භුක්තිය උවමනා ප්‍රස්ථාවකදී ආපසු ගතහැක.

7. බස්නාහිර පළාතේ දිසාපතිතුමාගෙන් ලියවිල්ලකින් ලබාගත් අවසරයක් නොමැතිව මිලයටගත් අය විසින් එකී ඉඩමේ හෝ ගොඩනැගිලිවල බද්ද වෙන කෙනෙකුට පැවරීම විකිණීම හෝ දෙවන බද්දක් දීම තහනම්ය.

8. මිලයටගත් අය විසින් පොල්ගස් රා හෝ තෙලිජ්ජ ගැනීම සඳහා මැදීමට ඉඩදීම තහනම්ය.

9.* බද්ද අවසානවන්ට ප්‍රථම එම ඉඩම සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ආණ්ඩුවට උවමනා කළහොත් මාසයක් කල් ඇතුව දැන්වීමක් කළවිට එය ආණ්ඩුවට භාරදිය යුතුයි. ආණ්ඩුව විසින් භුක්තිය භාරගනුලැබූ ඉඩම් කොටසේ හෝ සම්පූර්ණ ඉඩමේ ඉතිරි බදුකාලයට වැටහෙන බදුමුදල නැවත මිලයටගත් අයට ගෙවනවා ඇත.

10. මිලයටගත් අය දිසාපතිතුමාට හෝ එතුමාගේ නියමයපිට පැමිණෙන කෙනෙකුට ඉඩම පරීක්ෂාකිරීම සඳහා සුදුසුවේලාවලදී ඊට ඇතුල්වීමට ඉඩහැරිය යුතුයි.

11. ඉඩමේ දැනට තිබෙන ලකුණු, කණු, අගල් ආදිය අස්කිරීමක් හෝ වෙනස්කිරීමක් නොකරීමට මිලයටගත් අය වගබලාගත යුතුයි.

12. ඉහතකී කොන්දේසි කඩකළහොත් එම ඉඩමේ භුක්තිය භාරගෙන මිලයටගත් අය හෝ ඔහුගේ වැඩකරුවන් එයින් අස්කිරීමට දිසාපතිතුමාට බලය තිබේ.

13. එක ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට දිසාපතිතුමාට බලය තිබේ.

ඉඩමේ තොරතුරු.

නො. 19,924 දරණ ප්ලෑනේ පෙන්නුම්කරණ මරදානේ අර්ත් තැපැල් කන්තෝරුව සඳහා ගත් පොල්ගස් 19ක්, කොස්ගස් 2ක්, පේරගස් 3ක්, අත්තික්කාගසක් සහ අලුත ගොඩනගනලද කාලික කඩ 2ක් සහ තාවකාලික ගොඩනැගිලි 4ක් ඇති ඉඩමයි.

වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින සිට 1932ක්වූ අප්‍රේල් මස 30වෙනි දින දක්වා පුත්තලමේ ලුණු කිරන ස්ථානවලින් ලුණු ගෙනගොස් කිරා උඩප්පුවේ ලුණු ස්ටෝරුවලට භාරදීමට කොන්ත්‍රාත්ගැනීම සඳහා ටැන්ඩර්යයි පිටකොලේ ලියා එවනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 5වෙනි දින දවල් 12 වනතුරු පුත්තලමේ උප ඒජන්ත උන්නාන්සේ විසින් භාරගනු ලැබේ.

ඉල්ලුම්කාරයන් විසින් මෙහි සඳහන් උවමනාවල් සිත්හි තබාගත යුතුයි.

(a) වර්ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 5වෙනි දිනට මත්තෙන් රු. 20ක් ඉල්ලුම්කාරයා විසින් කොයිම කච්චේරියක තුමූත් බඳින්ට ඕනෑය. ඉල්ලුම්කාරයින්ගේ ඉල්ලීම ඒත්තුගත්තාසින් පසු උප ඒජන්ත උන්නාන්සේ විසින් නියමකරණ සෑහෙන කාලයක් ඇතුළතදී ඉල්ලුම්කාරයා විසින් කොන්ත්‍රාත්තුවට බැඳෙන්ට බැරිවුණොත් එකී බැඳ තිබෙන මුදල තහනම්ට ගනු ලැබේ.

(b) ඉල්ලුම්පත්‍රය උප ඒජන්ත උන්නාන්සේට යවන්නාවූ වේලාවටම එකී ඉල්ලුම්පත්‍රයේ පිටපත් 2 ඉල්ලුම්කාරයා විසින් තැපෑලෙන් කොළඹ 'සෝල්ට් ඇඩ්වයිසර්' තුමාට යැවිය යුතුයි.

(c) ඉල්ලුම්කාරයින්ට නොතිසි බාරදීමට පුත්තලමේ ස්ථානයක් ඔවුන් විසින් නියමකළ යුතුයි.

(d) උඩප්පුවට පුත්තලමේ සිට ගෙණයන ලුණු ගොණිබරයකට පාරු කුලිය වෙන් වෙන් වශයෙන් ටැන්ඩර්කාරයන් විසින් සඳහන්කළ යුතුයි.

වැඩිදුර කාරණ පුත්තලමේ කච්චේරියෙන් දැනගන්ට පුළුවන.

කේ. අල්වාපුල්ලෙ,
ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙනුවට.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 14වෙනි දින
පුත්තලම් කච්චේරියේදීය.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධව වර්ෂ 1912යේ අංක 8 දරන ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

වර්ෂ 1928ක්වූ සැප්තැම්බර් මස 27වෙනි දින අංක 181කේ රා අරක්කු සම්බන්ධ දැන්වීමේ 6වෙනි සහ 7වෙනිවගන්ති ප්‍රකාර කටුපිටියේ තිබෙන රා තැබෑරුම් පහත සඳහන් ස්ථානයට ගෙනයෑම සම්බන්ධ දැන්වීමකි.

දැනට වැළඹවිල්ලිහත්පත්තුවේ තිරගන්දගේ නැගෙනහිර කෝරළේ කටුපිටියේ තිබෙන රා තැබෑරුම වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දින පටන් එම ගම පහත සඳහන් ස්ථානයට ගෙනයෑමට අදහස්කර තිබෙන බව මෙයින් දන්වමි.

මේ ගැන යම් විරුද්ධකමක් ඇත්නම් ඒ විරුද්ධකම වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 3වෙනි දින දක්වා ලියවිලිවලින්ද එම දින පෙරවරු 10ටත් 12ටත් අතර කුරුණෑගල කච්චේරියේදී කට වචනයෙන්ද මා වෙත කියා සිටින්ඩ පුළුවන.

(අත්සන්කළේ)
ජේ. ආර්. වෝල්ටර්ස්,
වයඹ දිසාවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1931ක්වූ අගෝස්තු මස 15වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ස්ථානයේ විස්තර.

කුරුණෑගල දිස්ත්‍රික්කේ වැළඹවිල්ලිහත්පත්තුවේ තිරගන්දගය නැගෙණහිරකෝරළේ කටුපිටියේ සිට දඹදෙණියට යන මහපාරේ සැතැප්ම 4ගේ කනුවට යාර 220කට නැගෙනහිරින් පිහිටි බලගන්වත්තේගේගේ තිබෙන අතු සෙවිලිකරනලද කාමර තුනකින් යුත් ගෙයින් මැද පිහිටි (විශාල ප්‍රමාණය 9′ 11″ × 9′ 2″) කාමරයයි.

මායිම්.

නැගෙණහිරට කුස්සි කාමරේ; බස්නාහිරට කාමරය; උතුරට සහ දකුණට ඉහත කියනලද ඉඩම.

---

වර්ෂ 1928ක්වූ සැප්තැම්බර් මස 27වෙනි දින අංක 181කේ රා අරක්කු සම්බන්ධ දැන්වීමේ 6වෙනි සහ 7වෙනි වගන්ති ප්‍රකාර කටුපිටියේ තිබෙන රා තැබෑරුම් පහත සඳහන් ස්ථානයට ගෙනයෑම සම්බන්ධ දැන්වීමකි.

දැනට කටුගම්පොලහත්පත්තුවේ කටුගම්පොල දකුණ කෝරළේ කරඋල්ලේ තිබෙන රා තැබෑරුම වර්ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 20වෙනි දින පටන් එම ගම පහත සඳහන් ස්ථානයට ගෙනයෑමට අදහස්කර තිබෙන බව මෙයින් දන්වමි.

ගේම් ගැන යම් විරුඬකමක් ඇත්නම් ඒ විරුඬකම වර්‍ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 3වෙනි දින දක්වා ලියමිලිවලින්ද එම දින පෙරවරු 10ත් 12ත් අතර කුරුණෑගල කච්චේරියේදී කටවචනයෙන්ද මා සමග කියා සිටින්ඩ-පුළුවන.

(අත්සන්කලේ)

ජේ. ආර්. වෝල්ටර්ස්,
වයඹ දිසාවේ ඒජන්ත උන්නාන්සේ.

වර්‍ෂ 1931ක්වූ අගෝස්තු මස 15වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

### ස්ථානයේ විස්තර.

කුරුණෑගල දිස්ත්‍රික්කේ කටුගම්පොලහත්පත්තුවේ කටුගම්පොල දකුණු කෝරලේ කරඋල්ලේ පිහිටි කහටගහ වත්තේ තිබෙන අතුසෙවිලිකරනලද කාමර දෙකකින් යුක්තයෙන් නැගෙනහිරට පිහිටි (විශාල ප්‍රමාණය 12′×10′) කාමරයකි.

### මායිම්.

උතුරට සහ දකුණට එකී ඉඩමද; නැගෙණහිරට ගෙයි ඉස්තෝප්පුවද; බස්නාහිරට එකී ගෙයි කුස්සිකාමරය සහ ඉඩමද.

---

### කෑගලු දිස්ත්‍රික්කයේ 1931–32 අරක්කු රේන්ද විකිණීම.

වර්‍ෂ 1931ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින පටන් වර්‍ෂ 1932ක්වූ සැප්තැම්බර් මස 30වෙනි දින දක්වා මාස 12කට (අවුරුද්ද 1ට) මීට යාකර තිබෙන හැඩුල් පත්‍රයේ සඳහන් කරණලද තැබෑරුම්වල අරක්කු විකිණීමේ තනි බලය සම්බන්ධව "සීල්" තබනලද ඉල්ලුම් (ටැන්ඩර්) පත්‍ර වර්‍ෂ 1929ක්වූ ජූලි මස 12වෙනි දින නො. 7,722 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිඩ්ධකර තිබෙන සියලුම ඇක්සයිස් ලයිසන්වලට වැටහෙන සාමාන්‍ය කොන්දේසිවලටද, වර්‍ෂ 1931ක්වූ මාර්තු මස 20වෙනි දින නො. 7,837වෙනි ගැසට් පත්‍රයේ ප්‍රසිඩ්ධකර තිබෙන අරක්කු විකිණීමේ කොන්දේසිවලට සහ නො. 216 දරණ ඇක්සයිස් කොන්දේසිවලටද, නො. 7,858 දරණ ගැසට් පත්‍රයේ සහ වර්‍ෂ 1931ක්වූ ජූලි මස 29වෙනි දින නො. 7,872වෙනි ගැසට් පත්‍රයේ කොන්දේසිවලට සහ සුදුසීල් බූම් අවේ අරක්කු බෝතලයක් රු. 2·75කට වැඩි මුදලකට නොවිකිණීමේ කොන්දේසියටද අනුව භාරගනු ලැබේ.

2. එක එක ටැන්ඩර් පත්‍රයට රු. 500 බැගින් කච්චේරියක හෝ ආණ්ඩුවේ මුදල් භාණ්ඩාගාරයේ මුදල් තැන්පත්කළ බවට කුවිතාන්සි පෙන්වූයිට උවමනාකරණ ටැන්ඩර් ෆෝර්ම කෑගල්ලේ කච්චේරියෙන් ලබාගත හැකිවේ.

3. සියලුම ටැන්ඩර් ෆෝර්මවල ඉහතකී ප්‍රකාර මුදල් තැන්පත්කළ කුවිතාන්සි අමුනාතිබිය යුතුවත්හැර ආවලංගු නොකළ රුපියල් දහයේ (10) මුද්දරයක් අලවා තිබිය යුතුයි.

4. එක එක ටැන්ඩර් පත්‍රය සීල් තබනලද කවරයක් තුළ බහාතිබිය යුතුවත්හැර එම කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "කෑගලු දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම්වලට ඉල්ලුම්පත්‍රය" යනු සඳහන්කර එකී ටැන්ඩර්පත්‍ර වර්‍ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 5වෙනි දින පෙරවරු 10ට ප්‍රථම කෑගල්ලේ ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේට ලැබෙන්ට සැලැස්විය යුතුයි.

5. කෑගලු දිස්ත්‍රික්කයේ තැබෑරුම් දෙකම ඒකාබද්ධවශයෙන් විකුණනු ලැබේ.

ඒ. ඊ. ක්‍රිස්ටෝෆෙල්ස්,
ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ.

වර්‍ෂ 1931ක්වූ අගෝස්තු මස 17වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

### හැඩුල් පත්‍රය.

නොම්මර 1. මලගම (පරණකූරුකෝරලේ කෑගල්ලේ වටුම).
නොම්මර 2. යටිටෝගොඩ (බෙලිගල්කෝරලේ).

---

### සුප්‍රිම් උසාවියේ දැන්වීම

ශ්‍රී ලංකාවිපයේ ගරුකටයුතු උතුම්වූ සුප්‍රිම් උසාවියෙන් මට ලැබීතිබෙන ආඥාවක බලය කරණකොටගෙණ මෙයින් ප්‍රකාශකරන්නේනම් ගාල්ල, මාතර සහ හම්බන්තොට දිසාවල ක්‍රිමිනෙල් නඩු විභාගය වර්‍ෂ 1931ක්වූ සැප්තැම්බර් මස 15වෙනි දින පෙරවරු 11 පැය පටන් ගාල්ලේ තිබෙන නඩුසාලාවේ පවත්වන්ට සෙදෙනවා ඇත. එහි යම් කාරණ ඇතුව සිටින සෑම දෙනාම යටකී ස්ථානයට යටකී වේලාවට ඇවිත් පෙණීහිටින්ට ඕනෑවත් ඇර අවසර ඉල්ලා ලබාගෙණ මිස එයින් පිටතට යන්ට නුපුළුවන් බවත් මෙයින් සෑමදෙනාටම දන්වන්නෙමි.

ජී. ඇස්. වුඩ්මන්,
පිස්කල් වම්හ.

වර්‍ෂ 1931ක්වූ අගෝස්තු මස 18වෙනි දින
ගාල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

---

### අන්‍ය දැන්වීම.

කොළඹ දිස්ත්‍රික්කුවේ සියනෑකෝරලේ ගඟබොඩපත්තුවේ පැලහැල පදිංචි දොන් තිමෝතියස් අමරකෝන් යන මම කෑගලු දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිඩ්ධ නොතාරිස් රාකනෙකුමෙන් පත්කරන පිණිස මෙවක්පටන් තුන්මාසයක් ගිය තැනදී රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලුම්කරන බව වර්‍ෂ 1907වෙනි අංක 1 දරණ ආඥාපනතේ 1B දරණ උප ලේඛනයේ 2වෙනි නියෝගයේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

ඩී. ටී. අමරකෝන්.

1931 ජූලි 20,
පැලහැල.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.